**කෘෂිකාර්මික අංශය නවීකරණය සඳහා වූ ව්‍යාපෘතිය- අදියර 02 -2023**

**--------------------------------------------------------------------------------**

කෘෂිකාර්මික අංශය නවීකරණය සඳහා වූ ව්‍යාපෘතිය - අදියර 02 හි 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතින්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2017 ජනවාරි 17 දින එළඹි අංක 5873-එල්කේ දරන මූල්‍ය ගිවිසුමේ උපලේඛන 02 හි II කොටසෙහි ආ.3 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළයුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය

මූල්‍ය ගිවිසුම අනුව, කෘෂිකර්ම අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ.
යාපනය, මුලතිව්, අනුරාධපුරය, මඩකලපුව, මාතලේ, මොණරාගල සහ පොළොන්නරුව යන දිස්ත්‍රික්කවල කෘෂි ඵලදායීතාවය ඉහළ නැංවීම, වෙළඳපොළ ප්‍රවේශයන් වැඩිදියුණු කිරීම සහ සුළු පරිමාණ ගොවීන්ගේ හා කෘෂි ව්‍යාපාර මගින් කෙරෙන අගය එකතු කිරීම් වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. තවද, තරඟකාරී සහ අලෙවිකළ හැකි භාණ්ඩ නිපදවීමට, වෙළඳපොළ අවශ්‍යතා සඳහා ඔවුන්ගේ හැකියාව වැඩිදියුණු කිරීම සහ වාණිජකරණය දෙසට ගමන් කිරීම යන කටයුතු සඳහා සුළු පරිමාණ ගොවීන්ට සහයවීම කෘෂිකාර්මික අංශය නවීකරණය සඳහා වූ ව්‍යාපෘතිය -02 අදියර යටතේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය. ගොවි පුහුණුව සහ ධාරිතා ගොඩනැගීම, නවීන කෘෂිකර්ම තාක්ෂණ ආදර්ශන උද්‍යාන (ඒටීඩීපී), නිෂ්පාදන සහ වෙළඳපල යටිතල පහසුකම් සංවර්ධනය සහ විශ්ලේෂණ සහ ප්‍රතිපත්ති උපදේශන සහාය යන සංරචක 04 ක් යටතේ ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක වේ.
මූල්‍ය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය ඇමරිකානු ඩොලර් මිලියන 86.865කට සමාන රු. මිලියන 26,059.5ක් වන අතර ඉන් ඇමරිකානු ඩොලර් මිලියන 61.295 කට සමාන රු.මිලියන 18,388.5 ක් සැපයීම සඳහා ජාත්‍යන්තර සංවර්ධන සංගමය එකඟ වී තිබුණි. ඊට අමතරව මහනුවර, බදුල්ල,අම්පාර, කිලිනොච්චිය සහ වවුනියාව යනාදී දිස්ත්‍රික්කවල කටයුතු ක්‍රියාත්මක කිරීමට යුරෝපා කොමිෂන් භාර අරමුදලින් ඇමරිකානු ඩොලර් මිලියන 25කට සමාන රු.මිලියන 7,494ක් ලැබී තිබුණි. ඉතිරි මුදල ඇමරිකානු ඩොලර් මිලියන 0.6කට සමාන රු. මිලියන 177 ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යනය කිරීමට බලාපෙරොත්තු වේ.

ව්‍යාපෘතිය එහි කටයුතු 2017 ජනවාරි 01 ආරම්භ කරන ලද අතර, 2021 දෙසැම්බර් 31 වනවිට නිම කිරීමට සැලසුම් කර තිබුණද පසුව 2024 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ 2.1 කොටසේ විස්තර කර ඇති කරුණු වල බලපෑම හැර, 2023 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි වියදම් ප්‍රකාශය හා එහි මුදල් ප්‍රවාහය සාමාන්‍යයෙන් පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගනන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන සාමාන්‍යයෙන් පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුනු පිළිබඳවපාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| අංකය | විගණන නිරීක්ෂණය | මුදල රු. (මිලියන) | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2023 දෙසැම්බර් 31 දිනට ලෝක බැංකුවේ/ අයිඩීඒ හි ණය ශේෂය වන ඇමෙරිකානු ඩොලර් මිලියන 49.7 සහ ඇමෙරිකානු ඩොලර් මිලියන 12.44 ක යුරෝපීය සංගම් ප්‍රදානයේ ශේෂය, රු. 323.92 ක මහ බැංකු විනිමය අනුපාතිකය භාවිතයෙන් රුපියල් අගයට පරිවර්තනය කළ යුතුය. නමුත් රු. 330.54ක විනිමය අනුපාත අගය පරිවර්තනය සඳහා භාවිතා කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය ප්‍රකාශනයේ පෙන්වා ඇති විනිමය වෙනස රු. මිලියන 262.65 කින් වැඩි වී තිබුණි. | 262.65 | 2024 දෙසැම්බර් 31 දිනට විනිමය අනුපාතිකය භාවිතා කරමින් ණය/ප්‍රදානයේ ඇමෙරිකානු ඩොලර් වටිනාකම රුපියල් අගයට බවට පරිවර්තනය කරන ලද අතර, පෙර වර්ෂයේදී ද එම ක්‍රියා පටිපාටිය අනුගමනය කරන ලදී. කෙසේ වෙතත්, 2024 වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණය යොදා ගනිමු. | නිවැරදි විනිමය අනුපාතය භාවිතා කරමින් විනිමය වෙනස නිවැරදිව ගණනය කළ යුතුය. |
| (ආ) | එකතුව රු. මිලියන 99.13ක් යුරෝ අරමුදල්වලින් දැරිය යුතු වුවද, ව්‍යාපෘතිය ආරම්භයේ සිට 2023 වසර අවසානය දක්වා නැගෙනහිර සහ උතුරු පළාත් කාර්යාල විසින් ලෝක බැංකු අරමුදල් වලින් එය වියදම් කර තිබුණි. | 99.13 | පිළිගනිමු. මෙය 2024 වර්ෂයේදී නිවැරදි කරන ලදී. | මූල්‍ය ගිවිසුම් ක්‍රියාවලියට අනුව ගෙවීම් සිදු කළ යුතුය. |
| (ඇ) | 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනයේ ලෝක බැංකු අරමුදල් සහ යුරෝ ප්‍රදාන අරමුදල් සඳහා පිළිවෙලින් රු. මිලියන 592.40 ක් සහ රු. මිලියන 46.72 ක් බැංකුවේ මුදල් ලෙස දක්වා තිබුණි, නමුත් අදාළ බැංකු ප්‍රකාශන ශේෂයන් 2023 වසර අවසන් වන විට පිළිවෙලින් රු. මිලියන 695.93 ක් සහ රු. මිලියන 84.28 ක් විය. එබැවින්, මුදල් පොතේ සහ බැංකු ප්‍රකාශන ශේෂයන් අතර රු.මිලියන 141.09 ක වෙනසක් නිරීක්ෂණය වී තිබුණි.ව්‍යාපෘතිය විසින් බැංකු සැසඳුම් සකස් කර නොතිබූ බැවින් විගණනයේදී වෙනස සත්‍යාපනය කරගත නොහැකි විය. | 141.09 | පිළිගනිමු. බැංකු සැසඳුම් ප්‍රකාශන සකස් කිරීමේ ප්‍රමාදයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ මූල්‍ය කළමනාකරණ කාර්ය මණ්ඩලය නොමැති වීමයි. | වෙනස්කම් හඳුනා ගැනීම සඳහා බැංකු සැසඳුම් කාලෝචිත ලෙස සකස් කළ යුතුය. |

## 2.2 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| අංකය | නීතිරීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම / විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | අංක 01/2019 හා 2019 මාර්තු 15 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය | ව්‍යාපෘති මෙහෙයුම් කමිටු (පීඑස්සී) රැස්වීම මාස දෙකකට වරක් පැවැත්විය යුතුය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුළ පීඑස්සී රැස්වීම් හතරක් පමණක් පවත්වා තිබුණි. | මාස දෙකකට වරක් එම රැස්වීම් පැවැත්වීමට සෑම උත්සාහයක්ම ගන්නා ලදී. | ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව චක්‍රලේඛ උපදෙස් අනුව පැවැත්විය යුතුය. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| ව්‍යාපෘතිය 2017 ජනවාරි 17 වන දින ආරම්භ වූ අතර 2023 දෙසැම්බර් 31 වන විට ඉලක්කයෙන් සියයට 80 ක් සම්පූර්ණ කිරීමට සැලසුම් කර තිබුණද, 2023 දෙසැම්බර් 31 වන විට සමස්ත භෞතික ප්‍රගතියෙන් සියයට 75 ක් පමණක් වාර්තා කර තිබුණි . | ව්‍යාපෘති කාලය තුළ ඇති වූ බාහිර සාධක වන කොවිඩ් වසංගතය, ආර්ථික අර්බුදය ව්‍යාපෘතියේ මූල්‍ය හා භෞතික ප්‍රගතියට ඍජුවම බලපාන ලදී . | සැලසුම් කළ පරිදි ව්‍යාපෘති ප්‍රගතිය කඩිනම් කිරීමට පියවර ගත යුතුය. |

### 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අනුරාධපුර දිස්ත්‍රික්කයේ රාජාංගණය ප්‍රදේශයේ ක්‍රියාත්මක ඇඹුල් කෙසෙල් ව්‍යාපෘතිය සඳහා රු. 44,585,198 ක ඇස්තමේන්තුවක් මත වගා ළිං 18 ක් ඉදිකිරීම සඳහා 2022 පෙබරවාරි 07 දින පෞද්ගලික ආයතනයක් වෙත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි.කොන්ත්‍රාත්තුව අනුව වගා ළිං ඉදිකිරීම 2022 අප්‍රේල් 07 දිනට අවසන් කළ යුතුව තිබුණි. 2024 අප්‍රේල් 08 දින වන විටද වගා ළිං 7ක් ඉදිකිරීම අවසන් කර නොතිබුණු අතර ළිං 2ක් භාවිතා කර නොතිබුණි. 2023 ජනවාරි 06 දිනට පසුව වගා ළිං ඉදිකිරීම සඳහා දින දීර්ඝ කිරීම් ලබා දී නොතිබුණි. | කෘෂි ළිං 18 න්, කෘෂි ළිං 16 ක් කොන්ත්‍රාත්කරු විසින් නිම කර ඇති අතර, කෙසේ වෙතත්, කෘෂි ළිං 2 ක එම ළිංවල බිත්ති කඩා වැටී තිබුණි. | ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් සැලසුම් කළ පරිදි සම්පූර්ණ කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මධ්‍යම පළාත් නියෝජ්‍ය ව්‍යාපෘති කාර්යාලයේ ඉදිකිරීම්වලට අදාල ප්‍රසම්පාදන ගොනුවල දුර්වලතා හේතුවෙන් , කොන්ත්‍රාත්කරුවන්ගේ තොරතුරු, කොන්ත්‍රාත්තුවේ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් බැදුම්කර වලින් අයකරගැනීම්, කොන්ත්‍රාත්තුව ආරම්භකල දිනය, ව්‍යාපෘති අවසන් කල යුතු දිනය, රඳවාගැනීම්, ගෙවීම් කිරීම ආදී තොරතුරු නිවැරදිව හඳුනාගත නොහැකි විය. | පිළිගනිමු. මෙය දැන් නිවැරදි කර තිබේ. කෙසේ වෙතත්, අඩුපාඩු සඳහා වගකිව යුතු නිලධාරියාගේ සේවා කොන්ත්‍රාත්තුව දීර්ඝ කර නොමැත. | ලේඛන නිසි ආකාරයෙන් පවත්වාගෙන යා යුතුය. |
| (ඇ) | ගෝනවැව වෙළඳපොළ ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම සඳහා ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය (සීඅයිඩීඒ) විසින් සී -6 ශ්‍රේණියේ හෝ ඊට ඉහළ ශ්‍රේණියේ ලංසුකරුවන්ගේ සුදුසුකම් විශේෂයෙන් ඉල්ලා සිටියද , කොන්ත්‍රාත්තුව සී -7 ශ්‍රේණියේ ලංසුකරුවෙකුට රු. මිලියන 11.10 කට ප්‍රදානය කරන ලදී . තවද, 2023 සැප්තැම්බර් 13 වන දින වැඩ ආරම්භ කිරීම සඳහා අත්තිකාරම් වශයෙන් රු. මිලියන 2.2 ක් ගෙවා තිබුණු අතර 2024 ඔක්තෝබර් 28 වන දින දක්වා වැඩ ආරම්භ කර නොතිබුණි. | පිළිගනිමු. කොන්ත්‍රාත්තුව අවසන් කරන ලද අතර, මෙම ගැටලුව සඳහා වගකිව යුතු පළාත් ඉංජිනේරුවරයාගේ සේවා කොන්ත්‍රාත්තුව දීර්ඝ නොකරන ලදී. | ඉදිකිරීම් කටයුතු සඳහා කොන්ත්‍රාත්කරුවන් සඳහා සුදුසු කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඈ) | මධ්‍යම පළාතේ නියෝජ්‍ය ව්‍යාපෘති කාර්යාලය මගින් වේවැල්ලව වැව ප්‍රදේශයේ රු.මිලියන 14 ක ඇස්තමේන්තුවක් මත නල ලිං 14 ක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව 2023 අප්‍රේල් 24 දින ප්‍රදානය කර තිබුණි. ඉදිකිරීම් කටයුතු අවසන් කල යුතු දිනය 2023 සැප්තැම්බර් 24 දින වුවත් 2023 දෙසැම්බර් දක්වා ඉදිකිරීම අවසන් කර නොතිබුණු අතර නල ලිං 2 ක වැඩ ආරම්භකර නොතිබුණි. | නළ ළිං 14 ක ඉදිකිරීම් දැනට අවසන් කර ඇති අතර ගොවීන් තම වගාවන් සඳහා එම පහසුකම භාවිතා කරමින් සිටී. | කලින් නිශ්චය කරන ලද කාල රාමුව තුළ ඉදිකිරීම් අවසන් කළ යුතුය. |
| (ඉ) | ඌව පලාතේ බුත්තල වගුරුවෙල ප්‍රදේශයේ පැෂන් වගා ව්‍යාපෘතියේ ගොවීන් 34කගේ භාවිතය සඳහා රු. මිලියන 34 ක ඇස්තමේන්තුවක් මත අමුණක් ඉදිකිරීම සඳහා 2019 ජුනි 17 දින පුද්ගලික ආයතනයක් වෙත කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. 2023 වර්ෂය අවසාන වන විටද අමුණ ඉදිකිරීම අවසන් කර නොතිබුණි. ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටු නොවීම හේතුවෙන් පැෂන් වගා ව්‍යාපෘතිය අසාර්ථක වී තිබුණි. | වගුරුවෙල අමුණ ඉදිකිරීම 2024 දී අවසන් කර ඇති අතර ගොවීන්ට එයින් ප්‍රතිලාභ ලබා ගනී . | අපේක්ෂිත අරමුණු සැලසුම් කළ පරිදි සාක්ෂාත් කරගත යුතුය. |

### 3.3 වාරක පරීක්ෂණ නිරීක්ෂණ

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මහනුවර දිස්ත්‍රික්කයේ හසලක ප්‍රදේශයේ ගොවින් පිලිබඳ පූර්ව අධ්‍යනයකින් තොරව ඇලුමිනියම් ඉනිමං 400ක්, කෙසෙල් කැන් සඳහා පොලිතීන් ආවරණ සහ කෙසෙල් රෝපණ බෑග් මිලදී ගෙන තිබුණි. මිලදී ගත් උපකරණ හසලක ප්‍රදේශයේ වාර්ෂිකව රු. 360,000 කට කුලියට ගත් නිවසක ගබඩා කර තිබුණු අතර, ගබඩාවේ ආරක්ෂාව සඳහා වසරකට රු.936,000 ක් ගෙවීම සඳහා පෞද්ගලික සමාගමක් සමඟ ගිවිසුම් ගතවී තිබුණි. වසරක් සඳහා දරන ලද රු.1,296,000 ක වියදම අනාර්ථික බව නිරීක්ෂණය විය. | ප්‍රතිලාභී ගොවීන්ගේ ඉඩම් වගා කිරීමට සූදානම් වන තුරු එම යෙදවුම් ඔවුන්ට බෙදා නොදෙනු ලැබේ. එබැවින් එය ආරක්ෂිත භාරයක ගබඩා කිරීම අවශ්‍ය වේ. | ක්‍රියාකාරකම් නිසි ලෙස සැලසුම් කළ යුතු අතර අරමුදල් ඵලදායීව හා කාර්යක්ෂමව භාවිතා කළ යුතුය. |

### 3.4 නිෂ්ක්‍රිය/ අක්‍රීය/ ඌන උපයෝජිත සම්පත්

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘති ගිවිසුම 2017 ජනවාරි 17 වන දින අත්සන් කරන ලද අතර 2021 දෙසැම්බර් 31 වන දිනට අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, ලෝක බැංකුව/අයිඩීඒ ව්‍යාපෘති කාලය 2024 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කිරීමට අනුමැතිය ලබා දී තිබුණි. 2023 දෙසැම්බර් 31 වන දිනට අරමුදල් භාවිතයේ ප්‍රගතිය සලකා බැලීමේදී, අයිඩීඒ ණය මුදලින් වෙන් කරන ලද ඇමරිකානු ඩොලර් මිලියන 61.295 ක අරමුදල්වලින් ව්‍යාපෘතිය ඇමරිකානු ඩොලර් මිලියන 44.677ක් පමණක් භාවිතා කර තිබුණු බව නිරීක්ෂණය විය . ප්‍රතිශතයක් ලෙස, එය සියයට 72.8 ක් විය.එබැවින්, අරමුදල් ශේෂය සමඟ ඉතිරි වසරක කාලය සලකා බැලීමේදී අරමුදල් භාවිතය අකාර්යක්ෂම බව නිරීක්ෂණය විය. | ව්‍යාපෘතිය පළමුව 2021 දෙසැම්බර් 31 වන දින වන විට අවසන් කිරීමට නියමිතව තිබුණු බව පිළිගැනෙන අතර, ව්‍යාපෘතියේ පාලනයෙන් ඔබ්බට ගිය සාධක හේතුවෙන්, නිම කිරීමේ කාලය 2024 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කරන ලදී. | අරමුදල් ඵලදායීව හා කාර්යක්ෂමව භාවිතා කළ යුතුය. |
| (ආ) | ප්‍රදාන ගිවිසුමට අනුව භාණ්ඩාගාර ලේකම් සහ යුරෝපීය කොමිසම අතර 2021 මැයි 17 වන දින අංක ටීඑෆ්ඕබී5383 ගිවිසුම අත්සන් කරන ලදී. යුරෝපීය කොමිසම ඇමරිකානු ඩොලර් | ව්‍යාපෘතිය පළමුව 2021 දෙසැම්බර් 31 වන දින වන විට අවසන් කිරීමට නියමිතව තිබුණු බව පිළිගැනෙන අතර, | ක්‍රියාකාරකම් නිසි ලෙස සැලසුම් කළ යුතු අතර අරමුදල් ඵලදායීව හා |

| | | | |
|---|---|---|---|
| | මිලියන 24.95 ක ප්‍රදානයක් ලබා දීමට එකඟ වී තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසන් වන විට යුරෝපීය කොමිසමේ ප්‍රදානයේ සමුච්චිත භාවිතය ඇමරිකානු ඩොලර් මිලියන 10.507 ක් පමණක් වූ අතර එය එකඟ වූ මුදලින් සියයට 42.12 ට සමාන විය. එබැවින්, ඉතිරි 57.88ක ප්‍රතිශතය වූ යුරෝපා සංගම් ප්‍රදාන අරමුදල් භාවිතය ඉදිරි වර්ෂය තුල අවිනිශ්චිතය. | ව්‍යාපෘතියේ පාලනයෙන් ඔබ්බට ගිය සාධක හේතුවෙන්, නිම කිරීමේ කාලය 2024 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කරන ලදී. | කාර්යක්ෂමව භාවිතා කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේදී ව්‍යාපෘතිය රු. මිලියන 4,765 ක ආපසු ගෙවිය හැකි විදේශ ණය සඳහා වෙන් කළ මුදලින් රු. මිලියන 3,742 ක් පමණක් භාවිතා කර තිබුණු බව නිරීක්ෂණය විය. එබැවින්, මුළු ප්‍රතිපාදනවලින් සියයට 21 ක් නියෝජනය කරන රු. මිලියන 1,023 ක ප්‍රතිපාදන ව්‍යාපෘතිය විසින් භාවිතා කර නොතිබුණි. | පිළිගනිමු. නමුත් අප අයවැය ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම භාවිතා කිරීමට සැලසුම් කරන ලදී. භාණ්ඩ නියමිත වේලාවට ලැබීම ප්‍රමාද වීම නිසා එය කළ නොහැකි විය. | අරමුදල් ඵලදායී හා කාර්යක්ෂමව භාවිතා කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය සඳහා යුරෝපීය කොමිසමේ ප්‍රදානයේ අයවැයගත දායකත්වය රු. මිලියන 3,000 ක් වූ අතර, ව්‍යාපෘතිය යුරෝපා සංගම් ප්‍රදානයෙන් රු. මිලියන 1,476 ක් පමණක් භාවිතා කර තිබුණු අතර එය එකඟ වූ මුදලින් සියයට 49 කට සමාන විය. එබැවින්, වර්ෂය තුළ සියයට 51 ක් ව්‍යාපෘතිය විසින් භාවිතා කර නොතිබුණි. | පිළිගනිමු. නමුත් අප අයවැය ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම භාවිතා කිරීමට සැලසුම් කරන ලදී. භාණ්ඩ නියමිත වේලාවට ලැබීම ප්‍රමාද වීම නිසා එය කළ නොහැකි විය. | නිසි ලෙස සැලසුම් කර අරමුදල් ඵලදායීව හා කාර්යක්ෂමව භාවිතා කළ යුතුය. |
| (ඉ) | 2023 වර්ෂය තුළ ප්‍රසම්පාදන 433 ක් සඳහා එකතු කරන ලද රු. 6,847,500 ක ආපසු නොගෙවන ටෙන්ඩර් තැන්පතු මුදල ව්‍යාපෘතිය විසින් 2024 දෙසැම්බර් 24 දින වන විට අමාත්‍යාංශයට මාරු කර නොමැති බව නිරීක්ෂණය විය.එබැවින්, මූල්‍ය ප්‍රකාශනය තුල බැර ශේෂයක් දක්වා තිබුණි. තවද, රු . 6,847,500ක මුදල වසරකට වැඩි කාලයක් බැංකු ගිණුමේ නිෂ්ක්‍රියව පැවති බව නිරීක්ෂණය විය. | ආපසු නොගෙවන ටෙන්ඩර් තැන්පතු කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයට ආපසු ගෙවන ලදී. | ආපසු නොගෙවන තැන්පතුව නියමිත කාලය තුළ මාරු කළ යුතුය. |
| (ඊ) | විගණනයට ලද තොරතුරුවලට අනුව, ලෝක බැංකුවේ ඉල්ලීම පරිදි 2022 සහ 2023 වසර සඳහා ගොවීන් සඳහා පොහොර බෙදාදීම ක්‍රියාත්මක කරන ලදී. මෙම ව්‍යාපෘතිය යටතේ ගොවීන්ගෙන් සියයට 25 ක දායකත්වයක් අය කරනු ලැබේ. එකතු කරන ලද සියයට 25 ක දායක මුදල වන රු. මිලියන 67 ක් 2024 දෙසැම්බර් 24 වන දින විට භාණ්ඩාගාරයට මාරු කර නොතිබුණි. මෙම මුදල මූල්‍ය ප්‍රකාශනය | පිළිගනිමු. ප්‍රතිලාභී දායක මුදල් ඒකාබද්ධ අරමුදලට මාරු කිරීමට කටයුතු කරමින් පවතී. | අරමුදල් කාලෝචිත ලෙස මාරු කළ යුතු අතර උපදෙස් වලට අනුකූල විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | තුල වෙනත් ගෙවිය යුතු අයිතමය යටතේ නිරූපණය කර තිබුණි. තවද, වසරකට වැඩි කාලයක් බැංකු ගිණුමේ රු. මිලියන 67 ක මුදලක් නිශ්ක්‍රියව පැවති බව නිරීක්ෂණය විය. | | |
| (උ) | ඌව පළාත් නියෝජ්‍ය ව්‍යාපෘති කාර්යාලයට අයත් ගොවීන් වෙත බෙදාදීම සඳහා ව්‍යාපෘතිය විසින් මිලදී ගන්නා ලද රු. 32,224,000 ක් වටිනා පොලිතීන් මල්ච් රෝල් 380 ක් පැල්වෙහෙර කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සතු ගබඩාවක මාස 18 කට වැඩි කාලයක් නිශ්කාර්යව ගබඩා කර තිබුණි . | එම්ඩී -2 අන්නාසි වගාව අත්හිටුවීමට සිදු වූ බැවින්, මිලදී ගත් පොලිතීන් මල්ච් මුළු ප්‍රමාණයම ගොවීන් අතර බෙදා හරින ලදී. | අරමුදල් ඵලදායී හා කාර්යක්ෂමව භාවිතා කළ යුතුය. |

**3.5 මතභේදාත්මක ගනුදෙනු**

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඌව පළාත් ව්‍යාපෘති කළමනාකරණ ඒකකයෙන් ලැබිය යුතු රු. 1,000,000 ක අග්‍රිම මුදල 2023 දෙසැම්බර් 31 දිනට පියවා නොමැති බව නිරීක්ෂණය විය. මෙම මුදල 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනයේ ජංගම වත්කම් යටතේ වෙනත් අත්තිකාරමක් ලෙස නිරූපණය කර තිබුණි . | පිළිගනිමු. මෙය නිවැරදි කර ඇත . | අග්‍රිම වහාම පියවිය යුතුය. |
| (ආ) | යාපනය දිස්ත්‍රික්කයේ අර්තාපල් පොකුරු ව්‍යාපෘතිය | | |
| (i) | යාපනය ප්‍රදේශයේ ක්‍රියාත්මක කිරිමට යෝජිත පොකුරු අර්තාපල් ව්‍යාපෘතියට ඇතුළත් ගොවීන් වෙත බීජ අර්තාපල් බෙදාදීම සඳහා රු. 13,010,250 ක් වූ බීජ අර්තාපල් අල මෙ.ටො.20 මිලදී ගැනීමේදී තීරු කේත සඳහන් නොවීම හේතුවෙන් නිෂ්පාදකයාගේ විස්තර, අර්තාපල් අලයේ බර, නිෂ්පාදිත දිනය සහ කල් ඉකුත්වන දිනය හඳුනාගත නොහැකි වී තිබුණි. | බීජ අර්තාපල් මලුවල තීරු කේත නොතිබුණද, නිෂ්පාදනය, බර, නිෂ්පාදන දිනය, කල් ඉකුත් වීමේ දිනය ආදිය සම්බන්ධ තොරතුරු අර්තාපල් මලුවල ලේබලවල ඇතුළත් කර තිබුණි. | නිෂ්පාදන තොරතුරු හෙළිදරව් කළ යුතුය. |
| (ii) | යාපනය ප්‍රදේශයේ අර්තාපල් පොකුරු ව්‍යාපෘතිය සඳහා ආනයනය කල අර්තාපල් බීජවල ජියෝට්‍රිචම් නැමති දිලිරයක් දක්නට ලැබෙන බව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ශාක නිරෝධායන ආරක්ෂණ සේවයේ මූලික රසායනාගාර විමර්ෂන වාර්තාවේ සඳහන් කර තිබුණි. එබැවින් අර්තාපල් බීජ ගබඩා කිරිමේදී වැඩි සැලකිල්ලක් දැක්විය යුතු බවද සඳහන් කර තිබුණි. නමුත් බීජ ගබඩාකිරිමේදී වාතාශ්‍රය පහසුවෙන් නොලැබෙන වායුසමීකරණ නොකල ස්ථානයක ගෝනිවල අසුරා එකමත එක ලෙස ගබඩා කිරිම හේතුවෙන් ජියෝට්‍රිචම් දිලිරය ව්‍යාප්ත වී අර්තාපල් බීජ විනාශ වි තිබුණි. | කළමනාකාරිත්වය විසින් අදහස් දැක්වීම් සිදු කර නොමැත. | විශේෂඥයින් විසින් ලබා දෙන උපදෙස් අනුගමනය කළ යුතු අතර අරමුදල් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස භාවිතා කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) | යාපනය ප්‍රදේශයේ අර්තාපල් පොකුරු ව්‍යාපෘතිය සඳහා ආනයනය කරන ලද බීජ අර්තාපල් අල මි.මී 28 - මි.මී 55 අතර විය යුතු වුවද පරීක්ෂාවට ලක් කරන ලද බීජ වල ප්‍රමාණය මි.මී 70 - මි.මී 80 දක්වා පරාසයක් වී තිබුණි. බීජ අර්තාපල් අල ඇසුරුම් කරන ලද කි.ග්‍රෑ . 25 බෑග් 830 ක් තනි තනිව බර කිරා නොතිබුණි. | මෙම ප්‍රසම්පාදනය සඳහා අනුමත කරන ලද පිරිවිතරයන්ට අනුව, බීජයක ප්‍රමාණය මි.මී. 28-55 අතර පරාසයක් විය යුතුය. ව්‍යාපෘතියේ තාක්ෂණික කණ්ඩායම විසින් තහවුරු කරන ලද 95 ප්‍රතිශතය ප්‍රමාණයෙන් අනුමත පරාසය තුළ තිබුණි. | බීජ අර්තාපල් පිරිවිතරයන්ට අනුකූල විය යුතුය. |
| (iv) | ලෝක බැංකු අරමුදලින් ණය සහ පොළිය ආපසු ගෙවීම් පදනම මත ශ්‍රී ලංකා රජය ලබාගත් ණය මුදලින් ක්‍රියාත්මක වන මෙම කෘෂිකර්ම අංශ නවීකරණ ව්‍යාපෘතියේ යාපනය ප්‍රදේශයේ අර්තාපල් පොකුරු ව්‍යාපෘතිය සඳහා බීජ අර්තාපල් (රෙඩ් ලා සෝඩා) මිලදී ගැනීම, ගබඩා කිරීම, බැහැර කිරීම සහ වෙනත් වියදම සඳහා රු. 14,487,900 ක් වැය කර තිබුණි. මෙම වියදම නිෂ්කාර්ය වියදමක් බවත් අර්තාපල් බීජ අස්වැන්න ලබා ගැනිමේ අරමුණු ඉටුවී නොමැති බව නිරීක්ෂණය විය. | කළමනාකාරිත්වය විසින් අදහස් දැක්වීම් සිදු කර නොමැත. | අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ක්‍රියාකාරකම් නිසි ලෙස සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුය. |
| (v) | යාපනය ප්‍රාදේශයේ අර්තාපල් පොකුරු ව්‍යාපෘතිය සඳහා 2023 නොවැම්බර් මාසයේදී ආනයනය කරන ලද රෙඩ් ලා සෝඩා බීජ අර්තාපල් මෙ. ටො. 20 විනාශ වීම පිළිබඳව අංක ඒආර්අයි /ඩී /ඒඑස්එම්පී /අදියර 02/ඒ /2023/ඒකිව්/12 හා 2024 මාර්තු 31 දින විගණන විමසුම නිකුත් කර තිබුණි. එම විගණන විමසුමට පිළිතුරු ලෙස කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක ඒඑස්ආර්අයි/5/32/එම්අයිඑන්/ඒආර් /236 හා 2024 ජුලි 10 දිනැතිව විගණකාධිපති වෙත ඉදිරිපත් කරන ලද ලිපියේ විනාශ වූ බීජ වෙනුවට සැපයුම්කරුගේ වියදමින් ඉදිරි කන්නය සඳහා අවශ්‍ය බීජ ප්‍රමාණය සැපයීමට එකඟ වී ඇති බව දන්වා තිබුණි. නමුත් 2024 නොවැම්බර් දක්වා අර්තාපල් බීජ සපයා නොතිබුණි. | එකඟ වූ පරිදි, සැපයුම්කරු අවශ්‍ය ප්‍රමාණය සපයා තිබුණද, නිරෝධායන පරීක්ෂණ වලදී තොගය අසාර්ථක විය. | අලාභ හානි අයකර ගැනීමට පියවර ගත යුතුය. |
| (ඈ) | මාතලේ දිස්ත්‍රික්කයේ ලග්ගල ප්‍රදේශයේ එම්ඩී -2 අන්නාසි වගා ව්‍යාපෘතිය අසාර්ථක වීමෙන් පසු අන්නාසි වගාව වෙනුවෙන් ටී.ජේ.සී. අඹ වගා කිරිමේ ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 125ක ඇස්තමේන්තුවක් මත ගොවීන් 200කගේ දායකත්වයෙන් අක්කර 100ක් වගා කිරිමේ ව්‍යාපෘතියක් 2023 ජුනි මාසයේදී ආරම්භ කර තිබුණි. 2023 වර්ෂය අවසාන වන විටද ප්‍රතිලාභින් 100ක් පමණක් තෝරාගෙන තිබුණි. | කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සහ සමාලෝචන කමිටුවේ යෝජනාව සම්බන්ධයෙන් වෙනස් මතයක් තිබුණි. එබැවින් විකල්ප බෝගයක් සඳහා මාරු වීම හැර වෙනත් විකල්පයක් අපට නොතිබුණි. | අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ක්‍රියාකාරකම් නිසි ලෙස සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුය. |
| (ඈ) | ජාත්‍යාන්තර වෙළඳපොල සඳහා අපනයන භෝගයක් ලෙස අඹ වගාව නවීකරණ කිරිමේ අරමුණින් 2021 පෙබරවාරි 16 දින දඹුල්ල ප්‍රදේශයේ ගොවීන් 204 දෙනෙකු සහභාගි කරගෙන හෙක්ටයාර් 81 ක අඹ වගා කිරිම ආරම්භ කර තිබුණි. අඹ වගා ව්‍යාපෘතිය 2022 ජුනි | පාලනයෙන් බැහැර වූ සාධක හේතුවෙන් අපේක්ෂිත කාල රාමුව තුළ දඹුල්ල අඹ පොකුරු ව්‍යාපෘතිය ස්ථාපිත කිරීම සම්පූර්ණ කළ නොහැකි වූ බව | අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ක්‍රියාකාරකම් නිසි ලෙස සැලසුම් කර |

| | | | |
|---|---|---|---|
| | වන විටදී අවසන් කිරිමට යෝජිතව තිබුණද, ගොවින් වෙත බෙදාහැරිම සඳහා ව්‍යාපෘති විසින් අඹ පැල ලබා ගැනිම 2023 මාර්තු 16 දින සිදුකර තිබුණි. ඒ අනුව අඹ වගා ව්‍යාපෘතිය යෝජිත කාල රාමුව තුළ අවසන් කර නොතිබුණි. අඹ වගාව වන අලින්ගෙන් ආරක්ෂා කිරිමට අලි වැටක් ඉදිකිරිම සඳහා රු. 3,360,000ක් ඇස්තමේන්තු කර තිබුණද, අලි වැට ඉදිකර නොතිබුණි. ව්‍යාපෘති යෝජනාව අනුව, මාර්ග ජාලය වැඩි දියුණු කිරිම සඳහා රු. 36,480,000ක්, ජලාප්‍රවාහන ඇල ඉදිකිරිම සඳහා රු. 3,191,440ක්, කොම්පොස්ට් අංගනය ඉදිකිරිම සඳහා රු. 8,383,186ක් , ඩ්‍රෝන සමීක්ෂණය සහ සිතියම් ගත කිරිමට රු. 1,920,000ක් හා කොම්පොස්ට් අංගනයේ යන්ත්‍රෝපකරණ ලබා ගැනිමට රු. 4,975,000ක් යෙදවිමට සැලසුම්කර තිබුණද එකතුව රු. 54,949,626 ක් වූ එම ක්‍රියාකාරකම් ඉටු කර නොතිබුණි. ඒ අනුව අඹ වගා ව්‍යාපෘතිය අපේක්ෂිත ඉලක්ක කරා ලගා වි නොතිබුණි. | පිළිගැනේ. කෙසේ වෙතත්, 2024 ජුනි මාසය වන විට අඹ සිටුවීම අවසන් කර ඇත. | ක්‍රියාත්මක කළ යුතුය. |
| (ඉ) | උතුරුමැද පළාත වැනි බහුලව මිරිස් වගා කරනු ලබන ප්‍රදේශවල මෙන් කඳුකර ප්‍රදේශයන්හි තැනිතලා ඉඩමක් සොයා ගැනීමට නොහැකි වීම හේතුවෙන්, හෙල්මළු ක්‍රමය නිසා වැසි ජලයෙන් හා ගංවතුරෙන් මිරිස් වගාව විනාශ වී ඇති අතර ස්ථාන කිහිපයකින් අක්කර භාගයක පමණ ඉඩමක් සොයා ගැනීමට සිදුවී තිබුණි. තවද, පොම්ප භාවිතය සහ බිංදු ජල සම්පාදන පද්ධතිය අක්‍රිය වී තිබුණි.කුරුඳුවත්ත ප්‍රදේශයේ මිරිස් වියළීමේ යන්ත්‍රයක් සවිකර තිබුණද, වියළීමේ යන්ත්‍රයට ළඟා වීමට මිරිස් රැගෙන යන ගොවීන්ට ගොවිපළේ සිට කි.මීටර් 13- 40 ක් පමණ දුරක් ගමන් කිරීමට සිදුවීම නිසා වියළීමේ යන්ත්‍රය භාවිතයද අසාර්ථකවී තිබුණි. | ප්‍රතිලාභී ගොවීන්ගේ කොන්දේසි මෙන්ම ආකල්ප හේතුවෙන් වැඩසටහන සාර්ථක වූයේ නැත. එසේ ගොවීන්ට ලබා දුන් උපකරණ ආපසු ලබා ගන්නා ලදී. | ව්‍යාපෘති ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට පෙර ශක්‍යතා අධ්‍යයනයක් සිදු කළ යුතුය. |
| (ඊ) | භෞතික පරීක්ෂාවේදී, ගොවීන්ට බෙදා හැරීම සඳහා මිලදී ගත් ගොවි උපකරණවල ගැල්වනයිස් කරන ලද (ජීඅයි) පයිප්ප 213 ක අතිරික්තයක්, කෘමි නාශක රෝල් 177 ක හිඟයක්, ජල පොම්ප 139 ක හිඟයක්, පුට වැල් 07 ක හිඟයක් සහ තවාන් තැටි 12,105 ක හිඟයක් සහ මිරිස් බීජ කිලෝග්‍රෑම් 2.8 ක හිඟයක් ඇති බව නිරීක්ෂණය විය. බිඩින් සහ ස්පයිරල් ලැබීම් සහ නිකුත් කිරීම් වාර්තා කර නොතිබූ බැවින්, හිඟයක් සහ අතිරික්තයන් හඳුනා ගැනීමට නොහැකි විය. | අභ්‍යන්තර විගණකගේ සොයාගැනීම් මත අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ. | ව්‍යාපෘති ඉන්වෙන්ටරි සහ තොග සම්බන්ධයෙන් මු.රෙ. 751 අනුගමනය කළ යුතුය. |
| (උ) | භෞතිකව පරීක්ෂා කරන ලද වගා කරන ලද ඉඩම් 20 න්, එක් බිම් කැබැල්ලක් හැර, ඉතිරි වගා කරන ලද ඉඩම් 19 හි ගොවීන් ව්‍යාපෘතිය මගින් සපයන ලද භාණ්ඩ භාවිතා කර නොතිබුණි. ගංවතුර, වැසි හෝ සීතල කාලගුණය හේතුවෙන් එම වගා කරන ලද ඉඩම් 19 අසාර්ථක වී තිබුණි. | ප්‍රතිලාභී ගොවීන් වෙත ලබා දෙන ලද භාවිතයට නොගත් යෙදවුම් ආපසු ලබා ගැනීමට දැනටමත් කටයුතු ආරම්භ කර ඇත. | අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම සඳහා ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඌ) | යුරෝපා සංගමයේ ආධාර මත ක්‍රියාත්මක කරන ලද ඇස්තමේන්තුගත වටිනාකම රු.මිලියන 90 ක් වූ දෙමුහුන් බඩඉරිඟු බීජ ව්‍යාපෘතිය බදුල්ල දිස්ත්‍රික්කයේ කන්දකැටිය ප්‍රදේශයෙන් ආරම්භකර තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා ගොවීන් 50 දෙනෙකු සහ ගොවීන් සතු කුඹුරු අක්කර 50 ක් තෝරාගෙන තිබුණි. ව්‍යාපෘති නිර්ණායකයන්ට අනුව ගොවීන් තෝරා නොගැනීම, නිවැරදි වගා බිම් තෝරා නොගැනීම, වගා බිමට සුදුසු බීජ හඳුනා නොගැනීම සහ නියමිත කාලය තුළ බීජ, පොහොර හා කෘෂි රසායන ලබා නොදීම යනාදිය හේතුවෙන් ව්‍යාපෘතිය සම්පූර්ණයෙන්ම අසාර්ථකවී තිබුණි. ඒ සඳහා වැය වූ රු.මිලියන 2.67 ක වටිනාකම නිෂ්කාර්ය වියදමක් වී පැවතිණි. | මෙම භෝගය මිරිස් බෝගයට වෙනස් කරන ලද අතර ගොවීන් 14 දෙනෙකු ව්‍යාපෘතියෙන් ඉවත් වී ඇත. ගොවීන් 36 දෙනෙකු වගාවේ නිරතව සිටිති. | අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම සඳහා අරමුදල් ඵලදායීව හා කාර්යක්ෂමව භාවිතා කළ යුතුය. |
| (එ) | ඇස්තමේන්තුගත මුදල රු.මිලියන 32 ක් වූ සහ ප්‍රතිලාභීන් 100 දෙනෙකුගෙන් සමන්විත මුරුංගා ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 28.4 ක් වැයකර තිබුණද, මුරුංගා බීජ ලෙස දේශීය ප්‍රභවයන් වෙනුවට විදේශීය ප්‍රභවයන් යොදා ගැනීම හේතුවෙන් මුරුංගා වගාව අසාර්ථක වී තිබුණි. ඒ අනුව ඒ සඳහා වැයකළ රු.මිලියන 28.4 ක වියදම නිෂ්කාර්ය වී තිබුණි. | ඉන්දියානු ප්‍රභේදය සතුන්ගෙන් දැඩි ප්‍රහාරයක් එල්ල විය. ඒ අනුව ගොවීන් දේශීය ප්‍රභේදවලට යොමු වී ඇත. ගොවීන් 100 දෙනාගෙන් සියයට 50 ක් පමණ සාර්ථකව වගා කරන අතර අනෙක් අය ද වගාව ආරම්භ කර ඇත. | අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම සඳහා ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුය. |
| (ඒ) | රු.මිලියන 23ක් වටිනා ඉලෙක්ට්‍රොනික් තරාදි 23ක් ප්‍රසම්පාදනය කිරීමේදී විධිමත් ඇස්තමේන්තුවක් සහ පිරිවිතර සකස් කර නොතිබූ අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශයෙහි 2.14 වගන්තියට අනුව මිල ගණන් කැඳවා නොතිබුණි. තවද, ලංසු ඇපකරයක් හා වගකීම් කාලය පිළිබඳ ගිවිසුමකට එළඹීමට අපොහොසත් වීම සහ දේශීය නියෝජිතායතනවලින් මිල ගණන් ලබා නොගැනීම හේතුවෙන් දේශීය නියෝජිතයින්ගේ මිල ගණන් වලට වඩා රු.247,667 ක් ගෙවීමට සිදුවීමෙන් රජයට පාඩුවක් සිදුවී තිබුණි. | කළමනාකාරිත්වය විසින් අදහස් දැක්වීම් සිදු කර නොමැත. | රජයේ ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටි අනුගමනය කළ යුතුය. |

## 3.6 පද්ධති හා පාලනයන්

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතිය විසින් රු. 7,084,550 ක් වටිනා අධීක්ෂණ තොරතුරු පද්ධතිය (එම්අයිඑස්) ව්‍යාපෘතිය ආරම්භයේ සිට වසර හතරකුත් මාස පහකට පසුව 2021 මැයි මාසයේදී භාවිතා කරන ලදී. පිළිගත් පිළිවෙතට අනුව, ව්‍යාපෘතියක සියලුම පද්ධති සහ තොරතුරු ව්‍යාපෘති කාලය අවසානයේ අමාත්‍යාංශයට භාර දිය යුතුය. විගණනයට ලද තොරතුරුවලට අනුව, ව්‍යාපෘතිය 2024 දෙසැම්බර් 31 වන දින අවසන් වන නමුත් 2024 සැප්තැම්බර් 12 වන දින වන විට පද්ධතිය සහ තොරතුරු අමාත්‍යාංශයට භාර දීම පිළිබඳ විධිමත් සැලැස්මක් ව්‍යාපෘතියට නොතිබුණි. | සහන කාලය ඉකුත්වීමට පෙර, අධීක්ෂණ තොරතුරු පද්ධතිය (එම්අයිඑස්) අදාළ මූලාශ්‍ර කේත සහ මෙහෙයුම් අත්පොත් සමඟ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ජාතික කෘෂිකර්ම තොරතුරු සහ සන්නිවේදන මධ්‍යස්ථානය (එන්අයිඒඑසීසී) වෙත භාර දීමට දැනටමත් සැලසුම් කර ඇත. | ව්‍යාපෘතිය අවසානයේ රේඛීය අමාත්‍යාංශයට ව්‍යාපෘති වත්කම් භාරදීමට පියවර ගත යුතුය. |